# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**8 ශ්‍රේණිය** | **ගණිතය** | **ඒකකය 26 - ත්‍රිකෝණ නිර්මාණය**

(1)
1) අරය 3 cm වූ වෘත්තයක් නිර්මාණය කරන්න.
2) එම අරය සහිතව වෘත්තය සමාන කොටස් 6 කට ඡේදනය කර A, B, C, D, E, F ලෙස ලක්ෂ ලකුණු කරන්න.
3) එම ඡේදන ලක්ෂ 6 යා කර තල රූපයක් ලබා ගන්න.
4) ලැබූ රූපය හඳුන්වන නම සඳහන් කරන්න.
5) එම රූපයේ පාද වල දිග පිළිබඳව ඔබට කුමක් කිව හැකි ද?

(2)
1) AB = BC = CA = 5cm වූ සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
2) එහි කෝණ 3 හි අගයන් මැන ලියන්න.
3) කෝණ 3 හි අගයන් පිළිබඳ ඔබට කුමක් කිව හැකි ද?
4) ඉහත ත්‍රිකෝණයේ A කේන්ද්‍රය ලෙසද AB අරය ලෙසද ගෙන වෘත්තයක් නිර්මාණය කරන්න.
5) රූප සටහනට අනුව BC හඳුන්වන නම කුමක් ද?

(3)
1) පහත සඳහන් තොරතුරු අනුව ත්‍රිකෝණයක් නිර්මාණය කල හැකි අවස්ථා තෝරන්න.
   a) 4cm , 8cm, 6cm
   b) 3cm, 4cm, 5cm
   c) 25cm, 20cm, 15cm
   d) 30cm, 10cm, 10cm
   e) 6cm, 6cm, 6cm

2) PQ = 5cm, PR = 7cm, QR = 8cm වන,
   a) ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
   b) ත්‍රිකෝණය කුමන වර්ගයේ ද?

(4)
1) AB = 8cm වූ රේඛා ඛණ්ඩයක් අඳින්න.
2) AC = BC = 6cm වන සේ ABC ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
3) ත්‍රිකෝණයේ කෝණ 3 හි විශාලත්වය මැන ලියන්න.
4) කෝණ පිළිබඳව ඔබට ගත හැකි නිගමනය කුමක් ද?
5) මෙය කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?

(5)
1) KL = 8cm, LM = 6cm, KM = 10cm වූ ත්‍රිකෝණය නිර්මාණය කරන්න.
2) $K\hat{L}M$ අගය මැන ලියන්න.
3) KLM කුමන වර්ගයේ ත්‍රිකෝණයක් ද?
4) ත්‍රිකෝණයේ කෝණ මැන අගය එකතුව $180^\circ$ බව පෙන්වන්න.

සැකසුම :- ජේ.වරුෂවිතාන මිය.

Agaram.LK - Keep your dreams alive!